# පැරණි පුස්කොළ අත්පිටපත් තුළින් හෙළිවන වෛද්‍ය විද්‍යාත්මක ක්‍රම පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යයනයක් (අනුරාධපුර දිස්ත්‍රික්කය ඇසුරින්)

ආර්. එම්. කැලුම් පුෂ්පකුමාර[1]

## හැඳින්වීම

ශ්‍රී ලංකාව පුරාවටම පුස්කොළ අත්පිටපත් භාවිත වූ බව ප්‍රකට කරුණකි. වර්තමානය වන විට පුස්කොළ ලේඛනය සිදුවන්නේ සීමා සහිතවය. බෞද්ධ කෘති පමණක් පුස්කොළ ලේඛනාරූඪ වේ. පිරිත් පොත්, පන්සිය පනස් ජාතක පොත්, මෙහි විශේෂය. නක්ෂත්‍ර හා සම්බන්ධ ජන්ම පත්‍ර ලිවීම සඳහා යම් ප්‍රමාණයකට පුස්කොළය භාවිත වන බව දක්නට ලැබේ. අනුරාධපුර යුගයේ ශිලා ලේඛනවලින් ඇරඹුණ ලේඛන කලාව තල්පත්‍ර, දක්වා ව්‍යාප්ත වී මහනුවර යුගයේ 19 වන සියවසේ අග භාගය දක්වාම පුස්කොළ භාවිත වූ බවට සාධක පවතී. විවිධ විෂයන් යටතේ පැරණි දේශීය දැනුම ගොඩනැගී ඇත. එම දැනුම් සම්භාරය පුස්කොළ අත්පිටපත් හි අන්තර්ගත කර ඇත. පැරණි දේශීය දැනුම වර්තමානය ගොඩනැගීම සඳහා විශාල දායකත්වයක් දරයි. මෙම පැරණි දැනුම අතර වෛද්‍ය විද්‍යාව, ආයුර්වේදය, බෞද්ධ සාහිත්‍ය, ජ්‍යොතිෂ් ශාස්ත්‍රය, සිංහල සාහිත්‍ය, වාරි තාක්ෂණය, කෘෂි කාර්මාන්තය, ගුප්ත ශාස්ත්‍රය, යන්ත්‍ර මන්ත්‍ර, බලි තොවිල් වශයෙන් වර්ග කල හැක. මෙහිදී අපගේ ප්‍රස්තුත කාර්ය සඳහා දේශීය වෛද්‍ය විද්‍යා ක්‍රම භාවිතය පිළිබඳ දේශීය පැරණි ඥානය කෙතරම් දුරට විද්‍යාමාන වූයේද යන්න විග්‍රහ කෙරේ. චරක සංහිතාව කෘතියේ ආයුර්වේද වෛද්‍ය විද්‍යා ක්‍රම, අටක් දක්වා ඇත. ඒවා අෂ්ටාඞ්ග විද්‍යාව වශයෙන් සලකනු ලැබේ.

1. ශල්‍ය
2. ශලාක්‍යාය
3. කාය චිකිත්සා
4. කෞමාර
5. ධාත්‍ය
6. භූත විද්‍යා අගද තන්ත්‍ර
7. රසායන තන්ත්‍ර
8. වාජීකරණ තන්ත්‍ර

දේශීය වෛද්‍ය විද්‍යාව මෙම ක්‍රම යටතේ විහිදී ඇති බව පුස්කොළ ග්‍රන්ථ පරිශීලනයෙන් විද්‍යාමාන වේ. වෛද්‍ය විද්‍යාවේ කොටසක් වන භූත විද්‍යා අගද තන්ත්‍රය වර්තමානය වන විට වෙනම විෂයක් වශයෙන් ද වෙනම ගුරු කුලයක් වශයෙන් ද දක්නට ලබේ.

[1] දර්ශන විශාරද උපාධි අපේක්ෂක, rmkalump@gmail.com

චරක සංහිතාව කෘතියට අමතරව වෛද්‍ය විද්‍යාව හා සම්බන්ධ කෘතියක් වන සුශ්‍රැත සංහිතාව කෘතියේද අෂ්ට විද්‍යා ක්‍රම පිළිබඳව තුලනාත්මක කරුණු ඉදිරිපත් කර ඇත. මෙම කරුණුවලට අනුගතව බොහෝ තොරතුරු දේශීය පුස්කොළ අත්පිටපත්වල සඳහන් වේ. මෙම පුස්කොළ අත්පිටපත් බොහෝමයක් මුද්‍රණය වී තිබුණද, මුද්‍රණයට ලක් නොවූ ඉතා වටිනා පුස්කොළ ග්‍රන්ථ රාශියක් ඇත. සමහරක් ඒවා කලුවැදීමට ලක්වී නැත. අනුරාධපුර දිස්ත්‍රික්කයේ කරන ලද පර්යේෂණය මගින් පුස්කොළ අත්පිටපත් රාශියක් පරිශීලනය කිරීමට හැකිවිය. මේ අනුව ග්‍රන්ථ විඥාපන දැනුම පැරණි වෛද්‍යාචාරවරුන්ට උසස් ලෙස තිබී ඇත. පුස්කොළ පොත් සකසා ගැනීම, ලිවීම, සංරක්‍ෂණ කටයුතු කිරීම පරම්පරානුගතව පවත්වා ගැනීම සඳහා උපක්‍රම භාවිතය කරගෙන ඇත.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ පුරාණ ගම්මානවල මෙම පර්යේෂණ සිදුවේ. ප්‍රසිද්ධ හා අප්‍රසිද්ධ වෛද්‍ය වරුන් බොහෝ වේ. ඔවුන්ගෙන් බොහෝමයක් පැරණි පුස්කොළ ග්‍රන්ථවල ඇති වෛද්‍ය ක්‍රම අනුගමනය කරති. එම ක්‍රම අතර නස්න, බස්ම, තැවිලි, පෙවිලි, විතර්ක, දුම්දීම, බෙහෙත් ඔරුව, නිලවිදීම, නිල පිළිස්සීම, දූත ලක්‍ෂණ, වෙද ගැට ක්‍රම, යන්ත්‍ර, මන්ත්‍ර, බලි, සන්තික්‍රම, පිළිස්සුම්, ශල්‍යකර්ම, පංචකර්ම ක්‍රම, තත්කාල ක්‍රම, නලදිවීම, පංචපක්‍ෂි ක්‍රම නැකැත්, රසායන, ආදි විවිධ ක්‍රම භාවිත කරනු ලැබේ. මේ සඳහා වෛද්‍යාචාර්යවරයෙකුහට ග්‍රන්ථ විඥාපන දැනුම අවශ්‍ය වේ. පැරණි දේශිය දැනුම සංරක්‍ෂණය කර ඒවායින් ප්‍රයෝජනය ගැනීමට සුදුසුකාලය එළඹී ඇත. දිනෙන් දින පුස්කොළ ග්‍රන්ථ අභාවයට යමින් පවති. ශ්‍රී ලංකාවේ පුස්කොළ පොත් විශාල සංඛ්‍යාවක් විදේශ රටවල කෞතුකාගාරවල හා විවිධ ආයතනවල ඇත. දැනට ඉතිරිව ඇති පුස්කොළ ග්‍රන්ථ මුද්‍රණය කිරීමට කටයුතු කිරීම වැදගත් වේ. දේශීය වෛද්‍ය විද්‍යාව හා සම්බන්ධ පුස්කොළ ග්‍රන්ථ වැඩියෙන් ඇත. ඒවායේ විවිධ වෛද්‍ය විද්‍යා ක්‍රම බහුලව දක්නට ලැබේ. වර්තමානයට ගත හැකි විවිධ ක්‍රම ඒ අතර වේ. මෙයින් ප්‍රයෝජන ගැනීමට අදාල ආයතන ක්‍රියා කළ යුතුව ඇත.

**පර්යේෂණයේ වැදගත්කම**

දේශීය වෛද්‍ය විද්‍යාවට හිමිවන්නේ සුවිශේෂී තැනකි. අනාදිමත් කාලයක සිට ආයුර්වේද ක්‍රම හා දේශීය වෛද්‍ය ක්‍රම භාවිත වූ බවට සාධක ඇත. පුස්කොළ ලේඛන කලාව ඇරඹුමත් සමග විවිධ සාහිත්‍ය කෘති මෙන්ම විවිධ විෂයය න් බිහිවී ඇති බව පෙනේ. එම විෂයය න් අතර වෛද්‍ය විද්‍යාව සුවිශේෂී වුවකි. ඒ අනුව පුස්කොළ ලේඛන කලාවට දිගු ඉතිහාසයක් ඇත. මහවංශය, සමන්තපාසාදිකාව වැනි ඉතිහාස ග්‍රන්ථ ද චරකසංහිතාව, සුශ්‍රැත සංහිතාව, සාරාර්ථ සංග්‍රහය, වැනි

වෛද්‍ය ග්‍රන්ථ ද, පන්සියපණස් ජාතකය, සද්ධර්ම රතනාවලිය, පූජාවලිය, වැනි බෞද්ධ ග්‍රන්ථ ද පුස්කොළ අත්පිටපත් ආශ්‍රිතව ලියවී ඇති ඒවාය.
පුස්කොළ අත් පිටපත් පිළිබඳ පර්යේෂණ ඉතා අල්ප වශයෙන් සිදුවී ඇත. පුස්කොළ ග්‍රන්ථ පිළිබඳ පර්යේෂණයේදී, වෛද්‍ය විද්‍යාව මෙන්ම බෞද්ධ ග්‍රන්ථ, සාහිත්‍ය ග්‍රන්ථ, ආදි විවිධ අත්පිටපත් පිළිබඳ තොරතුරු හඳුනා ගැනීමට හැකියාව ඇත. මෙම පර්යේෂණය මගින් විනාශ වී යන පුස්කොළ ග්‍රන්ථ පිළිබඳ ග්‍රන්ථ නාමාවලින් බිහිවීම, අභාවයට යන දේශීය පැරණි ඥානය ආරක්ෂාකර ගැනීම, ග්‍රන්ථ විඥාපන තොරතුරු හඳුනාගැනීම ද සිදුවේ. විශේෂයෙන් ඓතිහාසික වටිනාකමක් ඇති මෙම පර්යේෂණය දේශීය අනන්‍යතාව තහවුරු කර ගැනීමට ද මග පෑදෙනු ඇත.

### පර්යේෂණයේ අරමුණු

ශ්‍රී ලංකාවේ පැරණි පුස්කොළ ග්‍රන්ථ දක්නට ලැබේ. පැරණි වෛද්‍යවරුන්, යන්ත්‍ර මන්ත්‍ර, බලිතොවිල් කරන ඇදුරන්, නක්ෂත්‍රවේදීන්, පුරාණ පන්සල් ආදියෙහි පුස්කොළ ග්‍රන්ථ සපයා ගැනීමට හැකියාව ලැබේ. මෙම පුස්කොළ ග්‍රන්ථවලින් ප්‍රයෝජනය ගනු ලබන්නේ ඉතාම සුළු පිරිසකි. පුරාණ ඥානය පුස්කොළ පොත විනාශ වීමත් සමග විනාශයට පත්වේ. අනුරාධපුර දිස්ත්‍රික්කයේ තොරාගත් මැතිවරණ කොට්ඨාස කීපයක ඇති පුරාණ ගම්මානවල මෙම පර්යේෂණය සිදුවේ. පහත සඳහන් අරමුණු පිළිබඳව අවධානය යොමු කරමින් විමර්ශනය කිරීමට බලාපොරොත්තු වේ.

- අනුරාධපුර දිස්ත්‍රික්කයේ පුස්කොළ භාවිතය පිළිබඳ කරුණු විමර්ශනය.
- පැරණි දේශීය දැනුම වෛද්‍ය විද්‍යාව තුළින් පිළිබිඹු කර ගැනීම.
- පාරම්පරික වෛද්‍ය විද්‍යාව හඳුනා ගැනීම.
- පුස්කොළ පොත්වල ඇති විෂය ධාරාව හඳුනාගැනීම.
- දැනට ඉතිරිව ඇති පුස්කොළ ග්‍රන්ථ සංරක්ෂණය කටයුතුවලට මග පෙන්වීම.
- රෝග හා රෝගකාරක හඳුනාගැනීම.
- ඒම රෝගවලට ඔසු භාවිතය හඳුනා ගැනීම.
- පුස්කොළ අත්පිටපත් තුළින් විවිධ වෛද්‍ය ක්‍රම භාවිත වූ බවට තොරතුරු හඳුනාගැනීම.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම පර්යේෂණය ඓතිහාසික පර්යේෂණයකි. පැරණි පුස්කොළ අත්පිටපතෙහි අන්තර්ගත දේශීය වෛද්‍ය විද්‍යාත්මක කරුණු මූලිකව පර්යේෂණයෙහි නියැලේ. මීට අමතරව විවිධ විෂයයන් යටතේ අන්තර්ගත විෂය කරුණු පිළිබඳව ද ගවේෂණයක් මෙමගින් සිදුවේ. ඒ අනුව ඓතිහාසික තොරතුරු හෙළිකර ගැනීමක් ද සිදුකෙරේ. ඒවා වර්තමානයට ගලපා ගැනීමට හැකියාව තිබේද යන්න සොයා බැලීමට මග පෑදෙනු ඇත. දේශීය ලේඛන කලාව පිළිබඳ ඓතිහාසික තොරතුරු මෙමගින් හෙළිකර ගැනීමට ද හැකියාව ඇත. පර්යේෂණයට අවශ්‍ය දත්ත ලබා ගැනීම සඳහා පහත සඳහන් ක්‍රම අනුගමනය කිරිමට බලාපොරොත්තු වේ.

01. ඉලක්ක කණ්ඩායම් සමග සාකච්ඡා පැවැත්වීම
02. පෞද්ගලික සම්මුඛ සාකච්ඡා පැවැත්වීම
03. අනුරාධපුර දිස්ත්‍රික්කයේ පුරාණ ගම්මානවලට ගොස් වෛද්‍යවරුන් හඳුනාගැනීම
04. දුරකථන මගින් සාකච්ඡා පැවැත්වීම
05. පුස්තකාල පර්යේෂණ සිදුකිරීම
06. කෞතුකාගාරවලින් තොරතුරු ලබාගැනිම
07. පුස්කොළ අත්පිටපත් කියවා තොරතුරු ලබාගැනීම
08. පුස්කොළ ග්‍රන්ථ කළු මැද කියවීම
09. ප්‍රාථමික දත්ත ලබා ගැනීම සඳහා පහත සඳහන් තාක්ෂණික ක්‍රම භාවිත වේ.
    I. කැමරා, ටේප් රෙකෝඩර් වැනි සන්නිවේදන උපකරණ යොදා ගැනීම
    II. පරිගණක හා ඒ ආශ්‍රිත උපකරණ භාවිතය
    III. අන්තර්ජාලය භාවිතය

**දත්ත විශ්ලේෂණය**

පර්යේෂණය මගින් හඳුනාගත් පුස්කොළ ග්‍රන්ථ විෂය අනුව වර්ග කිරීමට ලක් කෙරේ. එහිදී වෛද්‍ය විද්‍යාව හා සම්බන්ධ කෘති, බෞද්ධ ග්‍රන්ථ, නක්ෂත්‍ර ග්‍රන්ථ, යන්ත්‍ර මන්ත්‍ර, තන්ත්‍ර බලි තොවිල් වශයෙන් වර්ග වේ. මෙම ග්‍රන්ථවල සුවිශේෂී ලක්ෂණ හඳුනාගෙන ඓතිහාසික වටිනාකම මෙන්ම හඳුනා නොගත් ඥාන සම්භාරය වර්ගීකරණයකට භාජනය වේ.

**යෝජනා හා නිගමන**

පුස්කොළ ග්‍රන්ථ පිළිබඳ පර්යේෂණයේ දී විවිධ විෂයන් යටතේ ලියවී ඇති පුස්කොළ අත්පිටපත් රාශියක් හමුවිය. සමහර පුස්කොළ පොත් කියවීමට නොහැකි තරම් අබලන් වී ඇත. මෙම පර්යෙෂණයෙහි මූලික පරමාර්ථය වූයේ වෛද්‍ය විද්‍යා ක්‍රම හඳුනා ගැනීම මෙන්ම පුස්කොළ අත්පිටපත් ඒ සඳහා භාවිතා වූ ක්‍රම හඳුනා ගැනීමය. අනුරාධපුර දිස්ත්‍රික්කයේ පුරාණ ගම්මාන රැසක් මේ සඳහා යොදා ගැණුනි. පරම්පරාවෙන් වෙදකම් කළ නිවෙස් ඒ අතර විය. සමහර නිවෙස්වල විශාල පුස්කොළ අත්පිටපත් තිබුණද වෛද්‍ය කර්මයේ නොයෙදෙති. එයට හේතුව පාරම්පරික වෙදකම නැවතීම හේතුවෙනි. එහි ඇති පුස්කොල ග්‍රන්ථ රැසක් ආරක්ෂා කර ගැනීමට නොහැකි නිසා භාර ගැනීමට සිදුවිය. සමහර පුස්කොළ ග්‍රන්ථ කළුමැද නැත.

අභාවයට යන පුස්කොළ ග්‍රන්ථ සංරක්‍ෂණය කිරීම කාලෝචිතය. මෙම පුස්කොළ ග්‍රන්ථවල ඇති ඉතා වටිනා වෛද්‍ය ක්‍රම අභාවයට යා නොදී මුද්‍රණය කළ යුතුව ඇත.

දේශීය වෛද්‍ය විද්‍යාව අභාවයට යාමට තවත් වැදගත් කරුණක් විය. එනම් දේශීය ඖෂධ පැළෑටි වඳවී යැමේ තත්ත්වයයි. කෘෂි කර්මාන්තය සඳහා භාවිත වූ විවිධ වල් නාශක, කෘමි නාශක හේතුවෙන් එය සිදුවී ඇත. ඒ අනුව දේශීය ඔසු පැළ සංරක්‍ෂණය කිරීම හා වගා කිරීමට නිසි කාර්යයන් සිදු කළ යුතුව ඇත.

ප්‍රමුඛ පදඃ පුස්කොළ අත්පිටපත්, දේශිය වෛද්‍ය විද්‍යාව, ආයුර්වේදය, දේශිය වෛද්‍ය විද්‍යා ක්ෂේත්‍ර, පුස්කොළ පොත් හා දේශීය දැනුම